
# යටත් විජිත බැම්මෙන් ශ්‍රීලංකාව මිදුණ හැටි!



**ශ්‍රී ලංකාව සම්පූර්ණ වශයෙන්ම විදේශයක යටතට පත් වූ දිනය 1815 මාර්තු 2 වෙනි දා ය. ගිය සතියේ මාර්තු 2 වෙනි දාට එසේ සිදුවී වසර 196 ක් වෙයි. මේ ලිපිය ඒ වෙනුවෙනි.**

**ප**සුගිය මාසයේ 63 වන ශ්‍රීලංකා නිදහස් උළෙල මහත් ඉහළින් සැමරුහ.

1948 පෙබරවාරි 4 වෙනි දින බ්‍රිතාන්‍යය වෙතින් ලද නිදහස සැමරීමේදී 1815 මාර්තු 2 වන දින ශ්‍රීලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ලෙස පත්වීමේ සිට දිග හැරුණු සිද්ධි මාලාව විමසා බැලීම කාලෝචිත ය.

රාජ්‍යයක් ලෙස පැවැත්ම සඳහා භූමියක්, පාලන රටාවක්, පුරවැසියන්, අධිකරණ පද්ධතියක් හා ව්‍යවස්ථාදායකයක් තිබිය යුතුය. එසේම රාජ්‍යයක නිදහස අරභයා ප්‍රධාන සාධක තුනක් බැඳී පවතී. ඒවා නම් දේශපාලන, අධිකරණ හා මූල්‍ය නිදහසයි. 1505 සිට 1815 දක්වා ප්‍රතුගීසීහු, ලන්දේසීහු සහ ඉංග්‍රීසීහු ශ්‍රී ලංකාවේ ඒ ඒ පෙදෙස් නතුකරගෙන පාලනය කළෝය. එහෙත් ශ්‍රී වික්‍රම රාජසිංහ ශ්‍රීලාංකික අවසාන රජුගේ පාලනය බිඳ වැටී 1815 මාර්තු 2 දින අත්සන් කළ ප්‍රකට උඩරට ගිවිසුම නිසා මුළු මහත් ශ්‍රීලංකාවම මහා බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්විය.

එදා සිට 1948 දක්වාම ශ්‍රීලංකාවේ දේශපාලන, අධිකරණ හා මූල්‍ය පාලන කටයුතු ඉටු කළේ මහා බ්‍රිතාන්‍යයේ මනාපය පරිදිය. 1833 කෝල්බෲක් යෝජනා, 1910 මැනිං ප්‍රතිසංස්කරණ, 1931 ඩොනමෝර් කොමිස මේ යෝජනා, 1947 සෝල්බරි ව්‍යවස්ථාව ආදිය මගින් කලින් සඳහන් කළ තෙවැදෑරුම් නිදහස යම් තරමකට ළඟාකර ගත්තද බ්‍රිතාන්‍ය යටත් විජිත භාවයෙන් මිදීමට ඒවා ප්‍රමාණවත් නොවීය.

1947 තෙක්ම බ්‍රිතාන්‍ය ජාතික ගීය වන God Save the King ශ්‍රීලංකාවේ භාවිතා විය. නීති රීති, අණපනත් සම්මත කිරීමේ නෛතික බලය රැඳී තිබුණේ බ්‍රිතාන්‍යයටය. සිවිල් පාලනය, මූල්‍ය හා අධිකරණ කටයුතු මෙහෙයවනු ලැබූයේ බ්‍රිතාන්‍යය විසිනි. ඈත පිටිසර ගමක හේන් ගොවියෙකුට පවා අධිකරණ කටයුත්තකදී අවසාන තීන්දුව ලබාගන්නට සිදුවූයේ බ්‍රිතාන්‍ය අධිකරණයෙනි. මූල්‍ය ක්‍රමවේද, මුදල් නිකුත්කිරීම, ආදායම් පාලනය, රජයේ ඉඩම් පාලනය මෙහෙයවූයේ බ්‍රිතාන්‍යයි. සන්නද්ධ හමුදා, අධිකරණය, රාජ්‍ය අයතනවල සියළු මුද්‍රා සංකේත හා ලාංඡනවල පවා සටහන්වුණේ බ්‍රිතාන්‍ය සංකේතයන්ය. මුදල් නෝට්ටුවල ද එසේමය. රජයේ ප්‍රකාශන, දිවුරුම් පෙත්සම් ආදිය අත්සන් කළේ බ්‍රිතාන්‍ය රජුගේ නාමයෙනි.

ශ්‍රීලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ලෙස සැලකුවේ බ්‍රිතාන්‍ය විදේශ ප්‍රතිපත්තියයි. බ්‍රිතාන්‍ය තානාපතිවරයෙකු සිටින රටකට ශ්‍රී ලංකා ව වෙනුවෙන් තානාපතිවරයෙකු පත් නොකළේ ශ්‍රීලංකාවද මහා බ්‍රිතාන්‍යයට අයත් රටක් ලෙස සැලකූ නිසාය. එවැනි රටවලට පත් කළේ කොමසාරිස්වරයෙකි. 1935 දී සර් ඩී. බී. ජයතිලක ඉන්දියාවේ මහ කොමසාරිස් ලෙස ප්‍රථමවරට පත්කළේ එසේය.

අදටත් එම නිලනාමය එසේම පවත්වාගෙන යන්නේ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලට මහකොම- සාරිස් නිලනාමය සහිතවත්, අනෙකුත් රටවලට තානාපති නිලනාමය සහිතවත් පත්කර ගැනීමෙනි.

මෙම තත්වය වෙනස්කරවා ගැන්මට ශ්‍රීලාංකික නායකයෝ විවිධ යෝජනා ඉදිරිපත් කළහ. බ්‍රිතාන්‍ය යටත් විජිත භාවයෙන් මිදීමට උද්ඝෝෂණය කළහ. සුහද සාකච්ඡාවලද නිරත වූහ. ඒවායේ ප්‍රතිඵලයක් ලෙස 1946 දී ශ්‍රීලංකාවට නව ව්‍යවස්ථාවක් සැකැසීමට සෝල්බරි සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කෙරිණ. එවකට පේරාදෙනි විශ්වවිද්‍යාලයේ උපකුලපතිව සිටි සර් අයිවර් ජෙනිංස්ගේ කෙටුම්පත අනුව සෝල්බරි කොමිසම මගින් ශ්‍රීලංකාවට ස්වතන්ත්‍ර පාලනයක් ලබාදීමට කටයුතු කෙරිණ. ඒ අනුව එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙනුවට 1947 දී පාර්ලිමේන්තුව ස්ථාපිත කෙරිණ. බ්‍රිතාන්‍ය රජුගේ නියෝජිත ආණ්ඩු කාරවරයාගේ විධායක බලතල වෙනු වට අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩල යකට විධායක බලය පැවරිණ. ආණ්ඩුකාරයා වෙනුවට අග්‍රාණ්ඩුකාරවරයා නමින් නාමික බලයක් ස්ථාපිත කරවීය.

1947 අගෝස්තු මාසයේදී නව පාර්ලිමේන්තුව තෝරාපත්කර ස්ථාපිත කෙරුණද, ව්‍යවස්ථාදායක බලය පූර්ණ ලෙස එයට හිමි නොවීය. පාර්ලිමේන්තුවේ සම්මත වන යෝජනාවල අවසාන අනුමැතිය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට යටත්විය. එය වෙනස්කරවා ගැන්මට පූර්ණ නිදහස අවශ්‍ය විය. ඒ අනුව 1947 දෙසැම්බර් 1 වෙනි දින බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මගින් ශ්‍රී ලංකාවට පූර්ණ නිදහස දී යටත් විජිත භාවයෙන් මුදවාහැරිය යුතුයයි යෝජනාවක් සම්මත කෙරුණු අතර එය ක්‍රියාත්මකවන දිනය ලෙස පෙබරවාරි 4 වන දින නම් කෙරිණ. ශ්‍රීලංකාවේ නිදහස් දිනය වශයෙන් පෙබරවාරි 4 වන දින සැලකෙන්නේ ඒ නිසාය.

**ඒ අනුව 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ විත්තිකරුවන්ටත්, 1971 අප්‍රේල් කැරැල්ලේ රෝහණ විජේවීර ප්‍රධාන පිරිසටත් චෝදනා එල්ලකළේ රැජිණට හා ඇයගේ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව යටතේය.**

එසේ වුවද නිදහස් රාජ්‍ය පාලන රටාව මෙහෙයවීමට තරම් බුද්ධිමත්, කාර්යශූර, කායීමණ්ඩලයක් නැත යන අවතක්සේරුව යටතේ අධිකරණ ක්‍රියාවලියේ ඉහළ තීරණ ගැනීමේ නෛතික බලය පැවරුණේ මහා බ්‍රිතාන්‍යයටය. සෝල්බරි ව්‍යවස්ථාවේ ඒ බව පෙන්නුම් කර ඇත. ඒ අනුව 1962 රාජ්‍යවිරෝධී කුමන්ත්‍රණයේ විත්තිකරුවන්ටත්, 1971 අප්‍රේල් කැරැල්ලේ රෝහණ විජේවීර ප්‍රධාන පිරිසටත් චෝදනා එල්ලකළේ රැජිණට හා ඇගේ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව යටතේය.


1954 අප්‍රියෙල් මස බ්‍රිතාන්‍ය මහ රැජිණ ශ්‍රීලංකාවට පැමිණ පාර්ලිමේන්තුව ඇමතීමේදී මගේ ආණ්ඩුව මෙසේ ක්‍රියාකරනු ඇත යන සංකල්පය ප්‍රකාශ කළාය. මෙම ව්‍යවස්ථා බැඳීම වෙනස්කර ගැන්මට සෝල්බරි ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ **2 / 3** බහුතර ඡන්දයක් තිබිය යුතු වීය.

1970 බලයට පැමිණි සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය මෙම සෝල්බරි ව්‍යවස්ථාව ප්‍රයෝජනයට ගත්තාය. කොල්වින් ආර්. ද සිල්වා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් සකස් කෙරුණු ජනරජ ව්‍යවස්ථාවක් 1972 මැයි මස 22 වෙනි දින සම්මතකරගනු ලැබිණ. එයින් මහා බ්‍රිතාන්‍යයේ යටත් විජිත භාවයෙන් ශ්‍රීලංකාව සම්පූර් ණයෙන්ම මිදුනාය. සන්නද්ධ හමුදාවන්හි හෝ අධිකරණයේ හෝ වෙනත් රාජ්‍ය ආයතනවල හෝ එතෙක් පැවති සියළු බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනයන් ඉවත්කෙරිණි. උසාවිවල විනිශ්වයකරුවන්ගේ හිසට උඩින් එල්ලා තිබූ බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනයද ඉවත් කරන ලදී.

1815 මාර්තු 2 වන දින එවකට මහා බ්‍රිතාන්‍යයේ රජ කළ 3 වන ජෝර්ජ් රජු වෙනුවෙන් රොබර්ට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා වෙත උඩරට ගිවිසුම මගින් පැවරුණු ශ්‍රීලංකාව 1972 මැයි මස 22 වන දින සම්පූර්ණ නිදහස් රාජ්‍යයක් වූයේ ඒ අයුරිනි.

♦ ***මේජර් වී. බී. කරුණාරත්න***
**Major V. B. Karunaratne**
**Oxford UK**

**ජෝර්ජ් රජුගේ ජායාරූපය සහිත යටත් විජිත යුගයේ රුපියල් 10 ලංකා මුදල් නෝට්ටුවක් මේ-**




# ඉංග්‍රීසි කොඩිය කඩා බිමට දැමූ වාරියපොල හාමුදුරුවෝ

**සිං**හලේ අන්තිම රජු වන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු උඩරට සිංහළ නිළමේවරුන් විසින් ඉංග්‍රීසීන්ට අල්ලා දෙන ලදුව රජතුමා සිරකරුවෙකු වශයෙන් මුරිසි දිවයිනට පිටුවහල් කළාට පසු ඉංග්‍රීසීහු ලංකාව මුළුමනින්ම අල්ලා ගත්හ. ලංකාව දැන් එංගලන්ත රජුට අයත් බවත්, එතැන් සිට ශ්‍රීලංකාවේ සම්පූර්ණ පාලනය ඔවුන්ගේ බවත් කියැවෙන උඩරට ගිවිසුම අත්සන් කරන ලද්දේ වසර 196 කට පෙර එනම් 1815 මාර්තු 2 වන දින මහනුවර දළදා මාළිගාව ඉදිරියේ ඇති මහමළුවේ දීය. ඉංග්‍රීසීන් බාරගත් බවටත් තමන් එය බාර දුන් බවටත් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාද, ජෝන් ඩොයිලි ලේකම්වරයාද, සිංහළ ප්‍රධානීන්ද ඒ දෙපසින් ගිවිසුමට අත්සන් තැබූහ.

එදින උත්සවය පැවති මහමළුව උඩරට රජුන්ගේ රාජකීය උත්සව පවත්වන තැනයි. එදින එය ඉංග්‍රීසින් යටතේ ඉංග්‍රීසි හමුදා නිලධාරීන්ගේ මහේශාඛ්‍ය ලීලාවෙන්ද, උඩරට බෙර වෙනුවට ඉංග්‍රීසි ඩ්‍රම් වාදනයෙන්ද යුක්ත විය. රජු අල්ලා දුන් ඇහැලේපොළ ඇතුළු උඩරට නිළමේවරුන් සහ ප්‍රභූ පෙලැන්තිය ද අලංකාර වස්ත්‍රාභරණ හා ආයිත්තම් වලින් සැරසී **සුදු මහත්වරු** ළඟින්ම සිටියෝය.

ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ලංකාව යටත් බව කෙළින්ම කියාපාන ඉංග්‍රීසි කොඩිය එතැන මහමළුවේ ඔසවන ලදී. ඒ අවට සිටි සිංහළ ගැමි පිරිස් සහ භික්ෂූන් වහන්සේලා ද ඒ දෙස බලා සිටියේ කිව නොහැකි දුකකින් හා වේදනාවෙනි. එහෙත් ඔවුන්ට කර කියා ගත හැකි දෙයක් නැත.

එහෙත් සෙනග අතර සිටි වාරියපොළ සුමංගල හාමුදුරුවන්ට එය ඉවසා සිය නොහැකි දෙයක් විය. වහා ඉදිරියට දිව ගිය උන්වහන්සේ කොඩි ගසේ වූ කොඩිය කඩා බිමට දැමූහ. එකෙණෙහිම ඉංග්‍රීසි හටයෙක් තුවක්කුව අමෝරා වෙඩිතබන්නට තැත්කරත්ම ජෝන් ඩොයිලි ඉදිරියට පැන එය වළකා ලීය. යළිත් ඉන්පසු යළිත් ඒ කොඩිය ඔව්හු කැඩිය නොහැකි තරම් ඉහළට එසවූහ.

වාරියපොල හිමියෝ ඒ පළාතෙන් යන්නටම ගියහ. උන්වහන්සේ ආපසු තම පන්සලට ආවේ නැති බවත්, සිංහළ මිනිසුන් කෙරෙහි දැඩි ලෙස කළකිරී සිට අපවත්වූ බවත් කියති.

# ගඩාෆිගේ ප්‍රියතම හෙදිය
# Gaddafi's favourite nurse



Now it is a well known fact that Colonal Gaddafi's has a penchant for beautiful women.

Gaddafi relies heavily on his long-time Ukrainian nurse, **Galyna Kolotnytska**, who has been described as a "voluptuous blonde." Of the rumoured staff of four Ukrainian nurses that cater to the Leader's health and well-being, one informant emphasized to multiple Emboffs that Gaddafi cannot travel without Kolotnytska, as she alone "knows his routine."

When Kolotnytska's late visa application resulted in her Security Advisory Opinion being received on the day Gaddafi's party planned to travel to the U.S., the Libyan Government sent a private jet to ferry her from Libya to Portugal to meet up with the Leader during his rest-stop. Some embassy contacts have claimed that Gaddafi and the 38 year-old Kolotnytska have a romantic relationship. While he did not comment on such rumors, a Ukrainian political officer recently confirmed that the Ukrainian nurses " travel everywhere with the Leader."

**ලි**බියානු නායක ගඩාෆි ලස්සන ගැහැණුන්ට තද ඇල්මක් දක්වන බව රහසක් නොවේ. ඔහු පුද්ගලිකව තෝරාගත් සාත්තු සේවිකාවන් පිරිසක් යන යන ගමන් වලදී කැටුව යන බව කියති. ඒ අය අතර ඔහුගේ ප්‍රියතම හෙදියක් සිටී. යුක්රේනියානු ජාතික තරුණියක වන ඉතා සුරූපී ඇයගේ නම ගලීනා කොලොට්නිස්කා ය. ඇය නැතිව ගඩාෆි කොහේවත් අඩිය තියන්නේ නැති බව ඔහුගේ සමීප පිරිසේ අයගෙන් දැනගන්නට ලැබේ. ඔහුගේ සෞඛ්‍යයේ අඩු ලුහුඬුකම් දන්නේ ඇය පමණක් බවත් ඔහුගේ මානසික යහ පැවැත්ම ගැන ඇය ඉතා සෙවිල්ලෙන් සිටින බවත් ඇගේ අවවාද ඔහු ඉහළින් පිළිගන්නා බවත් තතු දන්නෝ කියති.

වරක් ගඩාෆි ඇතුළු පිරිස ඇමරිකාවට සංචාරයට ගිය ගමනකට ගලීනා ට ඇමරිකන් වීසා ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් ඒ ගමනට එක්- වන්නට නොහැකි වූ විට ගඩාෆි ජෙට් යානයක් යවා ඇය ගමනේ අතර මග විවේක ගන්නට පිරිස නැවතුණු පෘතුගාලයට ගෙන්වා ගෙන ඇත.

ගලීනාට ගඩාෆි දක්වන විශේෂත්වය සහ අසාමාන්‍ය සැලකීම නිසාම ගඩාෆිගේ සමීපතම අය සිතන්නේ ගලීනා සමග ඔහු ප්‍රේම සම්බන්ධයක් ඇතිකරගෙන සිටින බවයි.

මෙම ප්‍රේම සම්බන්ධය ඇත්තදැයි යුක්රේනියානු නිලධාරියෙකුගෙන් එක් වාර්තාකරුවෙක් ඇසූ විට ඔහු කීවේ ඒ ගැන තමා හරිහැටි නොදන්නා නමුත් නායකයා යන යන තැන ගලීනා ද යන බව නම් සැබෑයයි කියාය.